# <u>නිවේදනයයි</u>

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**<u>පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් කිරීම (ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණිය) -2022</u>**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණිය) තනතුරු වල පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවීමට අදාළ 2022.12.02 දින අමාත්‍යාංශ වෙබ් අඩවියට පළ කරන ලද ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය අනුව ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි සංශෝධනය කරන බව කාරුණිකව දන්වමි.

සංශෝධිත ලකුණු පටිපාටිය ප්‍රකාරව උක්ත පුරප්පාඩු සඳහා අයදුම්පත් යොමු කිරීමට අපේක්ෂිත ශ්‍රී ලං. අ.ප.සේ. I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන් වේ නම් මීට ප්‍රථම අමාත්‍යාංශ වෙබ් අඩවියේ 2022.12.02 දිනැතිව පල කර ඇති අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර **2023.03.31 දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ යොමු කළ යුතු අතර 2022.12.02 දිනැතිව අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කර ඇති නිවේදනය ප්‍රකාරව මේ වන විටත් අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

ලකුණු පටිපාටිය හැර අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලද නිවේදනය මඟින් දක්වා ඇති අනෙකුත් සියලුම කොන්දේසි නොවෙනස්ව පවතින අතර මේ වන විට අයදුම්පත් යොමු කර ඇති හා යොමු කිරීමට අපේක්ෂිත සියළු අයදුම්කරුවන් සංශෝධිත නව ලකුණු පටිපාටියට යටත් වන බව වැඩිදුරටත් දන්වමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

**එම්.එන්. රණසිංහ**
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

**2023.03. 20**

Scanned with MOBILE SCANNER